ශ්‍රී ලංකා වරාය අධිකාරිය

තනතුරු පුරප්පාඩු

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පහත සඳහන් තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් පසුරා ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

තනතුර සේවා ගණනය පුරප්පාඩු සංඛ්‍යාව	අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද	අනෙකුත් අනිවාර්ය අවශ්‍යතා	වැටුප් කේත අංකය හා වැටුප් පරිමාණය	සටහන	වයස් සීමාව
භාෂා පරිවර්තක (සිංහල/ ඉංග්‍රීසි) Translator (Sinhala-English) අධිශ්‍රේණිය (SG) පුරප්පාඩු සංඛ්‍යාව - 01	අ.පො.ස (උ.පෙළ) විභාගය එකවර විෂයයන් තුන (03) කින් සමත්වීම සහ අ.පො.ස (සා.පෙළ) විභාගයේදී සිංහල භාෂාව හෝ සිංහල සාහිත්‍යය හා ඉංග්‍රීසි භාෂාව හෝ ඉංග්‍රීසි සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම. සහ පිළිගත් ආයතනයක් මගින් නිකුත් කරන ලද භාෂා පරිවර්තනය (සිංහල - ඉංග්‍රීසි) පිළිබඳ ඩිප්ලෝමාව සමග රජයේ හෝ පිළිගත් පුද්ගලික ආයතනයක භාෂා පරිවර්තකයකු (සිංහල - ඉංග්‍රීසි) වශයෙන් වසර පහ (05) ක පළපුරුද්ද	i. සිංහල සහ ඉංග්‍රීසි භාෂාවන් පිළිබඳ මනා දැනීම. ii. සිංහල හා ඉංග්‍රීසි යන භාෂා දෙකෙන්ම පරිගණකය මගින් ලිපි සකස් කිරීමේ හැකියාව.	6.3 (SG 3) මූලික වැටුප් පියවර :- රු. 53,425/- වාර්ෂික වේතනාධිකය :- රු. 1,150/- (දළ වැටුප මාසිකව රු. 132,000ක් පමණ වේ.)	සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ ප්‍රායෝගික හා සම්මුඛ පරීක්ෂණයෙන් සමත්විය යුතුය.	අවුරුදු 18-45 අතර විය යුතුය. රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවනු ඇත. මෙම තනතුර සඳහා අයදුම් කරන සේවා මුක්ත හටයින්ට රාජ්‍ය පාරිපාලන අමාත්‍යාංශයේ අංක : 299 හා 1985.07.23 දින දරන චක්‍රලේඛ ප්‍රතිපාදන අදාළ වනු ඇත.

වෙනත්

සෑම අයදුම්කරුවෙකුම

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

iv. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණ අනුව හෝ තනතුරට අදාළ වනුයේ නම් වෛද්‍ය පරීක්ෂණයෙන්ද සමත් විය යුතුය.

v. මෙම තනතුර ස්ථිර තනතුරක් වන අතර, සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට හිමිකම් කියයි.

vi. රජයේ හෝ රාජ්‍ය සංස්ථාවන්හි සේවයේ නියුතු අපේක්ෂකයින් තම අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, ඉහත තනතුර සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් අදාළ දෙපාර්තමේන්තු / සංස්ථා සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවට සටහනක් තිබිය යුතුය.

සම්පූර්ණ ජීව දත්ත ඇතුලත්ව උප්පැන්න සහතිකය, අනෙකුත් අදාළ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සහතික - සේවා සහතිකවල පිටපත් සමග ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සහිතව සකස් කළ අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2026.11.16 දිනට පෙර පහත දක්වා ඇති ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. තැපැල්දී අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳ ශ්‍රී ලංකා වරාය අධිකාරිය වග කියනු නොලැබේ. **අදාළ අයදුම්පත් බහලු කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන),
මානව සම්පත් හා පරිපාලන කොට්ඨාසය,
ශ්‍රී ලංකා වරාය අධිකාරිය, කොච්චිකඩේ, කොළඹ 13.